**ඉරනමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ (අයිඅයිඩීපී) - 2015**

**-------------------------------------------------------------------------------**

ඉරනමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ (අයිඅයිඩීපී) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2012 ජනවාරි 30 දින එළඹි අංක අයි-857-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ, 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**-------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා හා ප්‍රදේශීය සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාතේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ වාරි යටිතල පහසුකම් ඵලදායි හා තිරසාර කළමනාකරණය දියුණු කිරීම හා ජලයේ හා භූමියේ ඵලදායිතාව තිරසාර සංවර්ධනයක් ලඟාකර ගැනීමයි. මූල්‍ය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,782.20 කට සමාන එජඩො මිලියන 29.32 ක් වන අතර, ඉන් රු.මිලියන 2,819.77 කට සමාන එජඩො මිලියන 22.23 ක් කෘෂිකාර්මික සංවර්ධන සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ඊට අමතරව, පිළිවෙලින් රු.මිලියන 160 කට සමාන එජඩො මිලියන 1.23 ක් හා රු.මිලියන 351 කට සමාන එජඩො මිලියන 2.70 ක් පුද්ගලික අංශය හා ප්‍රතිලාභීන් විසින් දායකවීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජනවාරි 30 දින ආරම්භ කරන ලද අතර, 2017 මාර්තු 31 දින නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට හා ව්‍යාපෘති විගණනය සඳහා වූ කෘෂිකාර්මික සංවර්ධන සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සිවිල් වැඩ සඳහා කරන ලද ගෙවීම් වලින් අඩුකර ගන්නා ලද රු.මිලියන 21.52 ක රැඳවුම් මුදල් ගිණුම්ගත කර නොතිබුණි. ඒ හේතුවෙන්, සිවිල් වැඩ වටිනාකම හා ගෙවිය යුතු රැඳවුම් මුදල් රු.මිලියන 21.52 කින් අඩුවෙන් දැක්වුණි.

(ආ) වටිනාකම රු. 254,300 ක වූ පරිගණක හා උපාංග සාවද්‍ය ලෙස සිවිල් වැඩ පිරිවැය යටතේ පෙන්වා තිබුණි. තවද, රු.මිලියන 1.86 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද ලී බඩු, යතුරු පැදි හා තොරතුරු තාක්ෂණ උපකරණ ද උපදේශන සේවා පිරිවැය යටතේ වර්ගීකරණය කර තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට වැඩ නිමකර නොතිබූ රු.මිලියන 490 ක වටිනාකම වූ සිවිල් වැඩ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ නිමකරන ලද සිවිල් වැඩ ලෙස එදිනට පෙන්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ, වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| කෘසංජාඅ | 22.23 | 2,819.77 | 846.60 | 3.35 | 459.04 | 9.02 | 1,197.97 |
| පෞද්ගලික අංශයේ දායකත්වය | 1.23 | 160.00 | - | - | - | 0.01 | 0.58 |
| ප්‍රතිලාභීන්ගේ දායකත්වය | 2.70 | 351.00 | - | 0.12 | 16.02 | 0.13 | 17.06 |
| ශ්‍රීලංර | 3.16 | 451.43 | 153.40 | 0.31 | 40.69 | 1.01 | 131.24 |
| එකතුව | 29.32 | 3,782.20 | 1,000.00 | 3.78 | 515.75 | 10.17 | 1,346.85 |

ඉහත තොරතුරු අනුව, රු.මිලියන 2,819.77 කට සමාන එජඩො මිලියන 22.23 ක් වූ වෙන්කිරීම් වලින් සියයට 40 ක් නියෝජනය වන රු.මිලියන 1,197.97 කට සමාන එජඩො මිලියන 9.02 ක් පමණක් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී වසර 04 ක් ගතවීමෙන් පසු ණය මුදලින් උපයෝජනය කර තිබුණි. තවද, 2015 දෙසැම්බර් 31 දිනට 01 සංරචකය යටතේ යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් සඳහා වෙන්කිරීම් වලින් සියයට 45 ක් හා 02 සංරචකය යටතේ නිෂ්පාදන ව්‍යාප්ත කිරීම හා අලෙවිකරණ කාර්යයන් සඳහා වෙන්කිරීම් වලින් සියයට 11 ක් උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියෙන් රැස්කරගත් තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පැකේජ 18 ක් යටතේ වූ සිවිල් ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට පැකේජ 39 ක් යටතේ වූ අනිකුත් සිවිල් ඉදිකිරීම් වැඩවල ප්‍රගතිය සියයට 17 සිට සියයට 67 දක්වා වූ පරාසයක පැවතුණි. තවද, 2015 දෙසැම්බර් 31 දිනට නිෂ්පාදනය, ව්‍යාප්තිය හා අලෙවිකරණය යටතේ වූ අනිකුත් ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය සියයට 61ක් පවතින බව ව්‍යාපෘතිය විසින් කරුණු දක්වන ලදී. තව දුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රගති වාර්තා අනුව, කිලෝමීටර 123 ක බෙදා හැරීමේ ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු වූ අතර ඒ අතුරින් කිලෝමීටර 85.62 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි. තවද, වාරිමාර්ග පද්ධතියේ නිර්මාණ 1,650 ක් පිළිසකර කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබූ අතර ඒ අතුරින් ව්‍යුහයන් 1,038 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට පිළිසකර කර තිබුණි. ඊට අමතරව, ජලමාපක 135 ක් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වුවද, ඇළ මාර්ග වල ජලමාපක පිහිටුවා නොතිබුණි. ව්‍යාපෘතිය ගොවිපල මාර්ග කිලෝමීටර 150 ක් පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනට එවැනි පුනරුත්ථාපන කාර්යයන් ආරම්භකර නොතිබුණි. තවද, ඇළ කණ්ඩි ශක්තිමත් කිරීමට කැළෑ ගස් 40,000 ක් රෝපණය කිරීමට බලාපොරොත්තු වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට ගස් 10,500 ක් පමණක් රෝපණය කර තිබුණි. ඊට අමතරව, ව්‍යාපෘතිය විසින් වගා ළිං 250 ක්, වියලන බිම් 21 ක් හා වී ගබඩා 03 ක් ඉදිකිරීමට සැලසුම් කලද අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

(ආ) ප්‍රමාදවී 2015 මැයි මස රාජ්‍ය නොවන සංවිධානය තෝරාගැනීම හේතුවෙන් ව්‍යාපෘතියේ නිෂ්පාදන හා අලෙවිකරණ සංවර්ධන කටයුතුවල මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. එම නිසා, සමාජ බලගැන්වීම් හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු කරන ලද රු.මිලියන 86.43 ක් අතුරින්, සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 14.34 ක මුදලක් වියදම් කර තිබුණි. රු.මිලියන 2.58 ක මුදලක් පමණක් පුහුණු කාර්යයන් සඳහා වියදම් කර තිබූ බව නිරීක්ෂණය වූ අතර රු.මිලියන 11.76 ක ඉතිරි මුදල, සමාජ බලගැන්වීම් හා පුහුණු කාර්යයන් සඳහා සේවයෙහි යොදාගත් රාජ්‍ය නොවන සංවිධානයේ පරිපාලන කාර්යයන් සඳහා වියදම් කර තිබුණි.

(ඇ) තවද, ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වූ ව්‍යාපෘති කාර්යාල 03 අතුරින්, නිෂ්පාදන ප්‍රවර්ධනය හා අලෙවිකරන උප සංරචකය යටතේ ව්‍යාපෘති කාර්යාල ස්ථාපිත කර නොතිබුණු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘති කාර්යාල සඳහා පුහුණු වීම් සපයා නොතිබුණි. ඒ හේතුවෙන්, කෘෂි ව්‍යාපාර වල තිරසාරත්වය සහතික කිරීම සඳහා වාණිජ වගාවේ නිවැරදි ක්‍රම යොදා ගැනීමට හා වාණිජ බැංකු විසින් සපයන ණය පහසුකම් භාවිතා කිරීමට ප්‍රදේශයේ ගොවීන්ව ප්‍රමාණවත් පෙළඹවීමක් සිදු නොකෙරුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් යොදාගන්නා ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය මූල්‍ය පාලනයේ ඵලදායි මෙවලමක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භක අවස්ථාවේ සිට එය සම්පූර්ණ වීම දක්වා ගනු ලැබූ එක් එක් තනි ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයන්හී පියවරයන් සහතික කිරීමට කොන්ත්‍රාත් වැඩ පැකේජ 136 ක් යටතේ සිදුකළ යුතු ප්‍රසම්පාදනයන් සඳහා කාලසටහන කාලානුක්‍රමික අනුපිළිවෙලකට පිළියෙල කර නොතිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 වගන්තියේ නියමයන් පරිදි පසුගිය වසර 04 පුරාම ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සඳහා සාමාජික පැමිණීමේ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ආ) සිවිල් වැඩ සඳහා වූ 2015 මැයි 13 දිනැති කොන්ත්‍රාත් ගිවිසුම අනුව, 2015 දෙසැම්බර් 16 දින වන විට පරන්තන් ප්‍රධාන ඇළ මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුගේ අසමත්බව හේතුවෙන් සියයට 55 ක වැඩ සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2015 නොවැම්බර් සිට අදාළ කාර්යයන් අත්හැර දමා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් පැකේජ 12 යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 10.8 ක සිවිල් වැඩ කොන්ත්‍රාත්, ගොවි සංවිධාන වෙත ඔවුන්ගේ මූල්‍ය හැකියාව හා අත්දැකීම් තක්සේරු කිරීමකින් තොරව පිරිනමා තිබුණු බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන්, උප - කොන්ත්‍රාත්කරුවන් මාර්ගයෙන් එම සිවිල් වැඩ සිදුකර තිබුණි.

**3.4 මූල්‍ය පාලනය සම්බන්ධ කරුණු**

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් සිදුකරනු ලබන කාර්යයන් ආවරණය කිරීමට ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන්හී අභ්‍යන්තර විගණන අංශ විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම හා ඒ අනුව විගණන වැඩසටහන පිළියෙලකර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද අභ්‍යන්තර විගණන කාර්යයන් හී ප්‍රමාණවත් නිරීක්ෂණ අභ්‍යන්තර විගණන වාර්තාවල ඇතුලත් නොවීය.

(ආ) එකතු කිරීමේ අගය මත බදු කාර්යයන් සඳහා ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකුට එකතුව රු.මිලියන 1.98 ක එකතු කිරීමේ අගය මත බදු ගෙවා තිබුණි. තවද, එකතු කිරීමේ බදු ගෙවන අවස්ථාවේදී අගය එකතු කිරීමේ බදු ලියාපදිංචිය හා ඒ අනුව ඉන්වොයිසියේ වලංගු බව ව්‍යාපෘතිය විසින් පරික්ෂා කර නොතිබුණි.